www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් ලිබියාවේ සංචාරයක

## US Secretary of State Condoleezza Rice visits Libya

**ඇන් ටැල්බට් විසිනි**
**2008 සැප්තැම්බර් 8**

අඩ සියවසකටත් වැඩි කාලයක් තුල, බලයේ සිටින එක්සත් ජනපද රාජ්‍ය ලේකම්වරයකු ලිබියාවට කල ප්‍රථම සංචාරය කොන්ඩලීසා රයිස් සිදු කලා පමනි. අවසන් වතාවට එවන් සංචාරයක යෙදුනු රාජ්‍ය ලේකම්වරයා වූයේ ජෝන් ෆොස්ටර් ඩලස් ය. ඒ 1953 දී, එනම් රයිස් ඉපදීමටත් පෙර ය.

මෙම කැපී පෙනෙන සිද්ධි දාමයේ දිග හැරීම මගින් ජනමාධ්‍ය පුදුමයට පත් කර ඇති බවක් පෙනී යයි. එය නිවේදනය කෙරුනේ අගහරුවාදා පැවති විශේෂ මාධ්‍ය හමුවක දී ය. රයිස් සෙනසුරාදා වාර්තාකරුවන් ද සිය ගුවන් යානයේ රැගෙන ලිබියාව කරා ගිය අතර, ඇගේ ගමන් මාවත කුමක් ද යන වග හෝ ලිබියානු නායක ජනාධිපති මුහම්බර් අල් ගඩාෆි සමග කුමක් සාකච්ඡා කිරීමට ඇය සැලසුම් කර තිබුනේ ද යන වග ඔවුහු ඒ වන විටත් දැන සිටියේ නැත.

ඇල්ජීරියාව හා මොරොක්කෝව ද ඇතුලත් වූ ඇගේ තුන් දින උතුරු අප්‍රිකානු සංචාරයට ලිබියාව ඇතුලු කිරීමට රයිස් ගත් තීන්දුව තුල යම් ආකාරයක කුලප්පු වූ ස්වභාවයක් දක්නට ලැබුනි. ලිබියාව සමග එක්සත් ජනපදයේ සබදතා පසුගිය පස් වසර තිස්සේ වැඩි දියුනු වී තිබේ. එක්සත් ජනපදය 2006 දී ලිබියාව සමග තානාපති සබදතා පුනස්ථාපනය කලේ ය. එහෙත් දෙරට අතර හමුවීම් මීට පෙර මෙවන් ඉහල මට්ටමකින් සිදු වී නැත. මෑත දී ලිබියාවේ සංචාරයක යෙදුනු ඉහල ම මට්ටමේ එක්සත් ජනපද නිලධරයා වූයේ මැද පෙරදිග එක්සත් ජනපදයේ විශේෂ නියෝජිත විලියම් බර්න්ස් ය.

රයිස්ගේ සංචාරය රාජ්‍යතාන්ත්‍රික ක්‍රියාදාමයේ ශීඝ්‍රතාවයේ නිශ්චිත වෙනසක් නියෝජනය කරයි. ඇය සිය සංචාරය "ඓතිහාසික මොහොතක්" ලෙස විස්තර කලා ය.

සිය සංචාරය එක්සත් ජනපදය තුල විවේචන අවුලවනු ඇතැයි යන්න ගැන දැනුවත්ව, රයිස් අවධාරනය කලේ, එය "උදා වූයේ බොහෝ අසීරුතාවන්ට, බොහෝ දෙනෙක්, විශේෂයෙන් ම ඇමරිකානුවන් බොහෝ දෙනෙක් අත්විඳි කිසිදාක අමතක කල හෝ තුනී කල නොහැකි දුක් වේදනාවන්ට පසුව" බව යි. "තව කාරනායක් වන්නේ මෙය උදා වූයේ මහා ජන නාශක අවි අත් හැරීමටත් ත්‍රස්තවාදය අතහැර දැමීමටත් ලිබියාව ගත් ඓතිහාසික තීන්දුවක ප්‍රතිඵලයක් ලෙස වීම යි."

"වඩා අවංකව පැවසුව හොත්, මා ලිබියාවේ සංචාරයක යෙදෙනු ඇතැයි මම කිසිදාක සිතුවේ නැත. එබැවින් එය තරමක් පුදුමයට කාරනාවක්" යයි රයිස් පැවසුවා ය.

එහෙත් ගඩාෆි සිය මහා ජන නාශක අවි වැඩපිලිවෙල අතහැරියේ 2004 දී, එනම් ඔහු සිය මස්ටර්ඩ් ගෑස් සහ නර්ව් ගෑස් යන මාරාන්තික විෂ වායූන්ගේ මූලාරම්භක සංයෝග තොග භාර දුන් විට ය. ඉන් යන්තම් මාස ගනනාවකට පසුව එක්සත් රාජධානියේ අගමැති ටෝනි බ්ලෙයාර් ලිබියාවේ පුද්ගලික සංචාරයක යෙදුනි.

ඉන් පසුව ප්‍රන්සයේ නිකොලස් සාර්කෝසි හා ඉතාලියේ සිල්වියෝ බර්ලුස්කෝනි යන ජනාධිපතිවරු ලිබියාවේ සංචාරය කර තිබේ. ගඩාෆි ම ප්‍රන්සයේ සංචාරයක යෙදී ඇති අතර එහි දී ඔහු එලිසි මාලිගාවේ තණ තිල්ලේ කඳවුරු ගසා ගත්තේ ය. ලිබියාව ඉතාලියේ විජිතයක්ව පැවති සමයේ එරටින් කොල්ලකන ලද සම්භාවනීය පිලිමයක් බර්ලුස්කෝනි ආපසු ලිබියාවට භාර දී ඇති අතර ඉතාලියේ අධිරාජ්‍ය අතීතය වෙනුවෙන් වන්දි ගෙවන බවට ද පොරොන්දු වී තිබේ.

ලිබියාවේ වන්දනා ගමනට එක්වීමේ රයිස්ගේ හදිසි තීන්දුව එකිනෙකට සම්බන්ධිත මෑත කාලීන සිදුවීම් දෙකක් පිලිබිඹු කරයි: එනම්, ජෝර්ජියාවේ ගැටුම සහ ඉතාලි බල ශක්ති ආයතනයක් වන ඊඑන්අයි හා ලෝකයේ විශාලතම ස්වාභාවික වායු නිෂ්පාදකයා වන ගෑස්ප්‍රොම් නම් රුසියානු බල ශක්ති සමාගම සමග ගිවිසුමක් අත්සන් කිරීමට ලිබියාව ගෙන ඇති තීන්දුව.

මෑත දී ලිබියාවේ කාර්යාලයක් විවෘත කල ගෑස්ප්‍රොම්, ලිබියාවේ සියලු අනාගත තෙල් හා ගෑස් සැපයුම් වෙලඳ පොල මිල ගනන්වලට මිලදී ගැනීමට කැමැත්ත පල

කර තිබේ. ලිබියාව අප්‍රිකාවේ සිවු වන විශාලතම ගෑස් සංචිත හිමි රට ලෙස විශ්වාස කෙරේ.

ඊඑන්අයි සමාගම ලිබියාව තුල සිය ගෑස් වත්කම් හවුලේ තබා ගැනීමට එකග වී ඇත. මධ්‍යධරනී මුහුද හරහා ඉතාලියට ගෑස් ප්‍රවාහනය කරන පවත්නා නල මාර්ගයේ ධාරිතාව වැඩි කිරීමට සමාගම දෙක සැලසුම් කරයි.

යුරෝපය වර්තමානයේ සිය ගෑස් සැපයුම්වලින් හතරෙන් එකක් ලබා ගන්නේ උතුරු අප්‍රිකාවෙනි. රුසියානු/ඉතාලි ගිවිසුම රුසියාවෙන් කෙරෙන ගෑස් සැපයුම මත පාලනය මෙන් ම මෙම වෙලඳ පොලෙහි හවුල්කාර කොටසක් රුසියාවට ලබා දෙනු ඇත.

එය රුසියානු භූමි ප්‍රදේශ හරහා ගමන් නොකරන බැවින් යුරෝපීය ඉන්ධන සැපයුම්වලට තීරනාත්මක වන බාකු-ටිබිලිසි-කෙහාන් නල මාර්ගය අවහිර කිරීම තමන්ට පහසුවෙන් ම කල හැකි බව ජෝර්ජියාවට තුල සිදු කෙරුනු රුසියානු මිලිටරි මෙහෙයුම් මගින් රුසියාව පෙන්නුම් කර තිබේ.

ගෑස්ප්‍රොම් සමාගමට ලිබියාව තුල ආධිපත්‍යයක් ලබා ගැනීමට ඉඩ දීම එක්සත් ජනපදයට කල නොහැකි ය. ඒ එවන් පියවරක් අප්‍රිකාව හා යුරෝපය යන මහාද්වීප දෙක තුල ම ඇමරිකානු ආධිපත්‍යයට වල කපනු ඇති බැවිනි. උතුරු අප්‍රිකානු බල ශක්ති වෙළඳ පොල තුලට කෙරෙන රුසියානු මැදිහත්වීමක පිනුම් පිත්තක් බවට ලිබියාව පත්වනු ඇතැයි යන්න පිලිබඳව රයිස් බෙහෙවින් ම උත්සුකව විය යුතු ය. මොරොක්කෝව සහ ඇල්ජීරියාව ගෑස්ප්‍රොම් සමාගමේ යෝජනාවක ඊලග ඉලක්ක ලෙස පවතී.

උතුරු අප්‍රිකානු බල ශක්ති සම්පත්වල පාලනයට ගෑස්ප්‍රොම් සමාගම දරන ප්‍රයත්නය වඩා පුලුල් රුසියානු මූලෝපායක කොටසකි. ඊඑන්අයි සමග ඇති කර ගත් තවත් ගිවිසුමක් මගින් නව දකුනු ප්‍රවාහ නල මාර්ගයක් ඉදි කිරිමට රුසියාව තීන්දු කර තිබේ. එය තුර්කියේ සිට දකුනු යුරෝපයට ගෑස් ප්‍රවාහනය කිරීමේ අභිප්‍රායෙන් යුක්ත එක්සත් ජනපදයේ පිටුබලය ලැබෙන නැබුකෝ නල මාර්ගය සමග තරග කරනු ඇත. උතුරු අප්‍රිකානු ගෑස් සැපයුමේ සැලකිය යුතු කොටසක පාලනය අත්පත් කර ගැනීමට දැන් රුසියාව සමත් වුව හොත්, එයට යුරෝපීය බල ශක්ති සැපයුම්වලට ඒකාධිකාරයකට ආසන්න තත්වයක් හිමි වනු ඇති අතර යුරෝපය තුල දැනට වඩා දැවැන්ත රාජ්‍යතාන්ත්‍රික භාරයක් භුක්ති විඳිනු ඇත.

පලමු වන ලෝක යුද්ධයට පෙරාතුව මහා බලවතුන් අතර හටගත් ආතති වර්ධනය වීම තුල උතුරු අප්‍රිකානු සම්පත් වැදගත් ක්‍රියාකලාපයක් ඉටු කලේ ය. රයිස්ගේ සංචාරය ඇඩගිර් සිද්ධියකට එතරම්ම සමාන නොවුනත්, එමගින් පෙන්නුම් කෙරෙන්නේ ජාත්‍යන්තර සබඳතා ගැටුම් ඇවිලීමේ හැකියාවන්ගෙන් පිරී ඇති බව යි.

රුසියානු ගෑස් දැවැන්තයා ලිබියාව ආකර්ෂනය කර ගැනීමේ උත්සාහයක යෙදී සිටීමේ වාසිය ඩැහැ ගැනීමට ගඩාෆි ඉක්මන් වී තිබේ. ඔහු රයිස් මුන ගැසෙනු ඇතැයි බලාපොරොත්තු වූයේ සිය කඳවුරේ දී ය. එහෙත් ඒ වෙනුවට ඔහු තෝරා ගත්තේ 1986 දී එක්සත් ජනපදය විසින් බෝම්බ ප්‍රහාරයක් එල්ල කරන ලද සිය අසිසියා මූලස්ථානයේ දී ඇයව මුන ගැසීමට යි.

ජනාධිපති රොනල්ඩ් රේගන් වරක් ගඩාෆි හැඳින්වූයේ මැද පෙරදිග "පිස්සු බල්ලා" ලෙස ය. ලිබියාව ඇමරිකාවේ ත්‍රස්තවාදී රාජ්‍ය ලැයිස්තුවට ඇතුලත් වුනි. එක්සත් ජනපදය සර්ටේ සමුද්‍ර සන්ධියේ දී ලිබියානු ජෙට් යානාවක් වෙඩි තබා බිම හෙලූ අතර 1986 දී ට්‍රිපොලි හා බෙන්ගසි නගරවලට බෝම්බ දමා ගඩාෆිගේ දියනිය ඇතුලු 40ක් ඝාතනය කලේ ය. එහෙත් ඇමරිකාව සමග ගඩාෆිගේ ගැටුම සෑම විටම සන්සිද්ධිමය ස්වභාවයක් ගත්තේ ය.

ලොව වටා සෙසු ජාතිකවාදී නායකයන් මෙන්, ගඩාෆි උත්සුක වූයේ ද ඔහුට සහයෝගය දෙන කල්ලියට සිය රටේ තෙල් ධන සම්පත්වලින් විශාල කොටසක් ලබා ගැනීම යි. ආරම්භයේ දී, අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවාවන්ගේ රූපාකාරයෙන් ජනගහනයේ බහුතරයකට සමහර සහන ලබා දුන් නමුත් ඔහු සියලු විරුද්ධත්වයන් ක්ෂමා විරහිත ලෙස මැඩී ය.

ශීතල යුද සමයේ එක්සත් ජනපදය හා සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය අතර ගැටුම යම් ආකාරයක උපාමාරු දැමීමේ නිදහසක් භුක්ති විඳිනු පිනිස යොදා ගැනීමට ගඩාෆි සමත් විය. එක් පාර්ශ්වයක් අනෙකට එරෙහිව යොදා ගැනීමට ඔහුට හැකි විය. එහෙත් ශීතල යුද්ධය අවසන් වීමත් සමග ම, ඔහු එක්සත් ජනපදයේ තුරුල්ලට යලි සිය මාවත සොයා ගෙන තිබේ.

"ත්‍රස්ත විරෝධී යුද්ධයට" සිය සහයෝගය ප්‍රදානය කිරීමට 9/11 මගින් ලැබුනු අවස්ථාව ඩැහැගත් ඔහු එක්සත් ජනපදයේ ඉරාක ආක්‍රමනයට සහයෝගය දුන්නේ ය. 1984 දී ලිබියානු තානාපති කාර්යාලය අසල දී වෙඩා තබා ඝාතනය කෙරුනු යොනේ ෆ්ලෙචර් නමැති පොලිස් කාන්තාවගේ පවුලට වන්දි ගෙවීමට ඔහු එකග විය. ඔහු ලිබියානු ආරක්ෂක ඒජන්ත අබ්දෙල් බසෙට් අල් මෙග්‍රාහි නෙදර්ලන්තයේ විශේෂ අධිකරනයකට භාර දුන් අතර, 1988 දී ලොකර්බි ප්‍රදේශයට ඉහල අහසේ දී පෑන් ඇම් 103 ගුවන් යානය බෝම්බ මගින් පුපුරවා හැරීම සම්බන්ධයෙන් එහි දී අල් මෙග්‍රාහි වරදකරු කරන ලදි. අවසානයේ ඔහු සිය මහා ජන නාශක අවි අතහැර දැමීමට එකග වූ අතර න්‍යෂ්ටික වැඩපිලිවෙලක් ලෙස ඔහු කියාපෑ ව්‍යාපෘතිය ද බිඳ විසිරවී ය.

එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍යය සම්බන්ධයෙන් ගත් කල, ගඩාෆිගේ හදවත වෙනස්වීම ඔවුන්ට රාජ්‍යතාන්ත්‍රික ජීවනාලියක් සම්පාදනය කලේ ය. ඉරාකය ආක්‍රමනය කිරීමට ගත් තීන්දුව ලාභාංශ ලබා දී ඇති බවටත් වරක් පර රාජ්‍යයක් හා ජාත්‍යන්තර ත්‍රස්තවාදයේ අනුග්‍රාහකයකු මිලිටරි බලයේ තර්ජනය යටතේ දිනා ගනු ලැබ ඇති බවටත් තර්ක කල හැකි විය.

එහෙත් එක්සත් ජනපදය හා එක්සත් රාජධානිය ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ ව්‍යසනයන්ට මුහුන දී ඇති තතු යටතේ, ගඩාෆි අවබෝධ කර ගෙන ඇත්තේ තමන්ට තවමත් යම් කේවල් කිරීමේ හැකියාවක් ඇති බව යි. ලිබියාවේ කඩා වැටෙන සෞඛ්‍ය සේවය තුල ලමුන් ගනනාවක් එච්අයිවී/ඒඩ්ස් ආසාදනයට ලක් වූ කල, විදේශ වෛද්‍ය සේවකයන් හය දෙනෙක් මරනීය දන්ඩනයට නියම කරනු ලැබ වසර අටක් තිස්සේ රඳවා ගන්නා ලදි. ඔවුන් නිදහස් කරනු ලැබුවේ, බෙංගාසි ලමා රෝහලට යුරෝ මිලියන 9.5ක් ගෙවීමටත් ලමුන්ගේ පවුල්වලට වන්දි ගෙවීමටත් යුරෝපා සංගමය එකඟ වීමෙන් පසුව ය. සම්පූර්න පැකේජය ම ඩොලර් මිලියන 460කට සමාන වූයේ යැයි විශ්වාස කෙරේ.

යුරෝපයේ බල ශක්ති අවශ්‍යතාව සහ යුරෝපීය බල ශක්ති වෙලඳ පොල කොටු කිරීමට රුසියානු කතිපයාධිකත්වයන් දරන ප්‍රයත්නය, එක්සත් ජනපදය සමග කේවල් කිරීමේ සිය හැකියාව ඉහල දමා ගැනීමේ පෙර නොවූ විරූ අවස්ථාවක් ගඩාෆිට සපයා තිබේ. පැහැදිලි කාරනාව නම්, සිය පැරනි අධිරාජ්‍ය-විරෝධී පූච්චානම් කරා ආපසු යෑමේ කිසිදු අභිප්‍රායක් ඔහුට නැති බව යි.

ඊජිප්තුවේ ජනාධිපති නසාර්ගේ ස්වාභාවික පසුප්‍රාප්තිකයා හා අරාබි ලෝකයේ නායකයා ලෙස ගඩාෆි වරක් තමා ම ඉදිරිපත් කර ගත්තේ ය. එහෙත් පසුගිය වසරේ දී අල් ජසීරා රූපවාහිනියට කතා කරමින් ඔහු කියා සිටියේ, රයිස් එහි ආධිපත්‍යය දරන බැවින් තමා යලි කිසි දිනක අරාබි සමුලුවලට නොයන බව යි. මැද පෙරදිග මත එක්සත් ජනපදයේ ආධිපත්‍යය ප්‍රශ්නයක් වනවා වෙනුවට, ඔහු ප්‍රකාශ කලේ එක්සත් ජනපද රාජ්‍ය ලේකම් පිලිබඳ ඔහුගේ හැඟීම්බර අගය කිරීම යි. "මම මගේ ආදරනීය කලු අප්‍රිකානු කාන්තාවට සහයෝගය දෙනවා." යයි ඔහු පැවසී ය. "ඇය හේත්තු වී ගෙන අරාබි නායකයන්ට අන පනවන ආකාරය මම අගය කරනවා, ඒ ගැන මට හරිම ආඩම්බරයි."

"ඔව්, ලීසා. ලීසා, ලීසා," යනුවෙන් ඔහු කියා ගෙන ගියේ ය. "මම ඇයට බොහොමත් ම ආදරෙයි. මම ඇයව අගය කරනවා. ඇය අප්‍රිකානු සම්භවයකින් යුක්ත කලු කාන්තාවක් නිසා මම ඇය ගැන ආඩම්බර වෙනවා."

රයිස් ලිබියාවෙන් පිටත්ව ආවේ ඇයට අවශ්‍ය සියල්ල ම ලබා ගෙන නොවේ. ෆති අල් ජහ්මි නම් 67 හැවිරිදි විපරිමතධාරියා නිදහස් කිරීම ගඩාෆි ප්‍රතික්ෂේප කලේ ය. එහෙත් මෙය බොහෝ සෙයින් කේවල් කිරීමේ පදනමකි. වර්තමානයේ ට්‍රිපොලි වෛද්‍ය මධ්‍යස්ථානයේ තනිව සිර කොට ඇති අල් ජහ්මි එක්සත් ජනපද තෙල් තාක්ෂන පහසුකම්වලට, ආයෝජනවලට හා මිලිටරි උපකරනවලට එදිරිව තරාදියේ දමා කිරා බලන බවට කිසිදු සැකයක් නැත.

ගඩාෆිට අධිරාජ්‍යවාදයෙන් යම් ආකාරයක ස්වාධීනත්වයක් ඇති බවක් හෝ තමන්ගේ ම ජනතාවට හෝ අප්‍රිකානු හා අරාබි මහජනතාවට විකල්ප ඉදිරිදර්ශනයක් ඉදිරිපත් කිරීමේ හැකියාවක් ඔහුට ඇති බවක් හෝ ගඩාෆි අත්පත් කර ගෙන ඇති වැඩි කේවල් කිරීමේ හැකියාව මගින් අදහස් නොකෙරෙයි. ඔහුගේ උත්සුකතාවට ලක් වී ඇත්තේ ලිබියානු ගෑස් හා තෙල් සඳහා තමන්ට ලබා ගත හැකි හොඳම ගනුදෙනුව ලබා ගැනීම පමනි. මෙම ගනුදෙනුවල වාසි ලැබෙනු ඇත්තේ ගඩාෆි හා ඔහුගේ පවුල වටා සිටින ප්‍රභූව අතට ය. සාමාන්‍ය වැඩ කරන ජනතාව අත්විඳිනු ඇත්තේ සිය ජීවන මට්ටම් තව දුරටත් පරිහානියට ලක් වීම පමනි.

ඔහු බලයට පැමිනි කල හඳුන්වා දුන් සුබසාධන ප්‍රතිසංස්කරනවලින් අවසානයට ඉතිරිව පවතින සියල්ල පුද්ගලීකරනය කිරීම සිය අභිප්‍රාය බව ගඩාෆි පැහැදිලි කර තිබේ. විදුලි බල හා දුරකතන සේවා පුද්ගලීකරනය කිරීමට නියමිත ය. සෞඛ්‍ය හා අධ්‍යාපන සේවාවන් ද ඒ මාවතේ ම යනු ඇත.

"අප අධ්‍යාපනය සඳහා අයවැයෙන් වෙන් කල මුදල් ගැන මා කියා සිටින්නේ ලිබියානු ජනතාවට එය ලබා ගැනීමට ඉඩ දෙන ලෙස යි." යයි ගඩාෆි මෑතක දී පැවසී ය. "එය ඔබේ සාක්කුවල දමා ගෙන ඔබේ දරුවන්ට ඔබට කැමති ආකාරයකට උගන්වන්න. ඔබ වගකීම ගන්න." එයින් අදහස් කෙරෙන්නේ අනාගතයේ දී අධ්‍යාපනය සඳහා ගෙවීමට ඔවුන්ට සිදු වන බව යි.

විදේශ සමාගම් සමග ඒකාබද්ධ හවුල් ව්‍යාපාරවලට එක් වීමට ලිබියානුවන්ට අවසර ලැබෙනු ඇත. මෙය වනාහි ජනසතු කෙරුනු සමාගම්වල වත්කම් අභිමි කිරීමේ වට්ටෝරුවකි. ගඩාෆි අනුගමනය කරන්නේ ජාත්‍යන්තර ප්‍රාග්ධනය සඳහා සිය වෙලඳ පොලවල් විවෘත කර ඇති සෙසු ජාතිකවාදී තන්ත්‍රයන් විසින් තහවුරු කරන ලද රටාවයි. එහි අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ ජනගහනයේ බහුතරය තව තවත් දුප්පත්කමේ පතුලට ම තල්ලු කිරීම සහ බලයේ සිටින තුනී ප්‍රභූව මීට පෙර හැකිව තිබූ මට්ටම් ඉක්මවා යන ආකාරයකින් තව තවත් ධනවත් කිරීම යි.